## මැතිවරණ කොමිෂන් සභාව

## සැපයුම් හා සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024

මැතිවරණ කොමිෂන් සභාව සඳහා 2024 වර්ෂයට පහත සඳහන් භාණ්ඩ සැපයීම හා සේවාවන් ඉටු කිරීම සඳහා ලියාපදිංචි නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන්/ නියෝජිතයන්/ පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| සැපයුම් | | | |
|---|---|---|---|
| අයිතම අංකය | අයිතමය | 23 | දෙපාර්තමේන්තු හැඳුනුම්පත් සකස් කිරීම |
| | | 24 | ටයර් මිලදී ගැනීම, ටියුබ්, බැටරි ඇතුළු උපාංග හා මෝටර් රථ අමතර උපාංග |
| 1 | ලිපි ද්‍රව්‍ය/ කාර්යාලයීය අවශ්‍යතා | 25 | මෝටර් රථ කුලියට ගැනීම |
| 2 | ලිපි කවර (මුද්‍රිත /අමුද්‍රිත)දත්ත මුද්‍රණය ඇතුළුව | 26 | ආහාර පාන සැපයීම (සැහැල්ලු ආහාර ඇතුළු) |
| 3 | කාඩ්බෝඩ් පෙට්ටි ඇතුළු කාඩ්බෝඩ් නිෂ්පාදන | 27 | නොමැකෙන තීන්ත |
| 4 | පොලිතින්, මුද්‍රිත පොලිතින් උර,පොලිතින් උර, පොලිසැක් බෑග් හා HDPE කවර | 28 | ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම |
| 5 | ආරක්ෂිත ස්ටිකර්, ටේප්, මුද්‍රිත ටේප්, ලොක්, ප්ලාස්ටික් ලොක් | 29 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම |
| 6 | පරිගණක, සර්වර්, ප්‍රින්ටර්, යූපීඑස්, ස්කෑනර්, ලැප්ටොප්, මල්ටිමීඩියා ප්‍රෝජෙක්ටර්, ජාල උපාංග ඇතුළු පරිගණක උපාංග හා මෘදුකාංග | 30 | පරිගණක සර්වර්, ප්‍රින්ටර්, යූපීඑස්, ස්කෑනර්, ලැප්ටොප්, මල්ටිමීඩියා ප්‍රෝජෙක්ටර් අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම |
| 7 | කාර්යාලීය ගෘහ භාණ්ඩ (ලී / වානේ /මෙලමයින්) | 31 | ශීතකරණ හා වායු සමීකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම. |
| 8 | කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ (ඡායා පිටපත්, ඩුප්ලෝ, ෆැක්ස් යන්ත්‍ර) | 32 | ජලමෝටර්, ජෙනරේටර්, ගිනි ආරක්ෂණ පද්ධතිය අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම. |
| 9 | මුද්‍රා වර්ග (රබර්, සෙල්ෆ් ඉන්ක්, දින මුද්‍රා) | 33 | ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම. |
| 10 | ශීතකරණ හා වායුසමීකරණ | 34 | ඡායා පිටපත්, ඩුප්ලෝ, ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම |
| 11 | ජෙනරේටර් යන්ත්‍ර හා ජල මෝටර් | 35 | විද්‍යුත් උපාංග හා කැමරා පද්ධති අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම |
| 12 | ඇඟිලි සලකුණු යන්ත්‍ර/ වේලා සටහන් යන්ත්‍ර | 36 | අභ්‍යන්තර දුරකථන පද්ධති නඩත්තු කිරීම හා සේවා කිරීම |
| 13 | ටෝනර්(ඡායා පිටපත්,පරිගණක මුද්‍රණ යන්ත්‍ර) සහ අනුපිටපත් යන්ත්‍ර සඳහා තීන්ත සහ මාස්ටර් රෝල්/රිබන් | 37 | වාහන විදුලි පද්ධති හා වායු සමීකරණ පද්ධති අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම/ වාහන කුෂන් කිරීම |
| 14 | මුද්‍රණ වැඩ කටයුතු (දත්ත මුද්‍රණය ඇතුළුව) | 38 | පවිත්‍රතා කටයුතු සිදු කිරීම |
| 15 | ගොඩනැඟිලි ද්‍රව්‍ය (සනීපාරක්ෂක උපාංග, පී.වී.සී./ජී.අයි. බට ඇතුළු උපාංග හා ජලනල උපාංග, විදුලි උපාංග, තීන්ත) | 39 | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර කුලියට ගැනීම |
| 16 | කැමරා හා ආරක්ෂිත කැමරා (ඩිජිටල්) | 40 | පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම |
| 17 | දුරකථන හා උපාංග | 41 | කෘමි මර්ධනය හා වේයන් මර්ධනය කිරීම |
| 18 | විද්‍යුත් උපකරණ හා උපාංග (රූපවාහිනී ආදී) | 42 | වාහන අලුත්වැඩියා කිරීම |
| 19 | ගිනි ආරක්ෂණ පද්ධති හා ගිනි නිවන උපකරණ | 43 | වාහන සේවා කිරීම |
| 20 | නාම පුවරු, බැනර් සැකසීම | 44 | සන්නිවේදන උපකරණ සමඟ ත්‍රී භාෂා සේවාවන් |
| 21 | පානීය ජල බෝතල්/ වෝටර් ඩිස්පෙන්සර් | 45 | ගොඩනැඟිලි කඩා ඉවත් කිරීම හා අබලි ද්‍රව්‍ය ඉවත් කිරීම. |
| 22 | තිරරෙදි ඇතුළු ඇඳ ඇතිරිලි, කොට්ටඋර ආදිය මිලදී ගැනීම | 46 | අභ්‍යන්තර හා උද්‍යාන අලංකරණය කිරීම, ගස්කපා ඉවත් කිරීම. |

2. ඉහත සඳහන් එක් එක් සැපයුම් හා සේවා සඳහා ලියාපදිංචිය වෙනුවෙන් වෙන් වෙන්ව ගෙවීම් කළ යුතුවේ.

3. සියලුම අයදුම්පත් මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන ශාඛාවෙන් ලබා ගත හැකි අතර එක් අයිතමයක් සඳහා ආපසු නොගෙවන ගාස්තු වශයෙන් රුපියල් 500.00 ක් බැගින් මුදලින් ගෙවා ලදුපත ලබා ගතයුතුය. ගාස්තු ගෙවීම රාජගිරිය මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ ගිණුම් ශාඛාව වෙත 2023 නොවැම්බර් 20 දින සිට 2023 දෙසැම්බර් 08 වන දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 අතර කාලය තුල ගෙවිය හැකිය.

4. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම්පත්, ගෙවුම් ලදුපතෙහි පිටපතක් සමඟ මැතිවරණ මහ ලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට 2023 දෙසැම්බර් 13 දින සවස 2.00 ට පෙර පැමිණ භාරදිය යුතුය. අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහල කෙළවරේ **"සැපයුම්/සේවාකරුවන් ලියාපදිංචි කිරීම-2024"** යනුවෙන් සඳහන් කළ යුතුය.

5. සැපයුම් හා සේවාවන් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත මිල ගණන් කැඳවීමේදී ප්‍රමුඛත්වය දෙනු ලැබුවද, අවශ්‍යතාවය පරිදි අනෙකුත් සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීමේ අයිතිය මැතිවරණ කොමිෂන් සභාව සතුය. ඉල්ලීම් කළ විට මිල ගණන් සපයනු නොලබන හෝ නියමිත වේලාවන් තුළදී භාණ්ඩ හා සේවා සපයනු නොලබන හෝ ලබා දෙනු ලබන අවශ්‍යතා වලට හා නියමිත ප්‍රමිතීන් වලට අනුකූල නොවන ලෙස සැපයුම් කරනු ලබන සැපයුම්කරුවන්ගේ නම්, අදාළ සැපයුම්/ සේවා ලියාපදිංචි ලේඛනයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

6. තවද මේ පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයට පැමිණ හෝ දුරකථන අංක 011-2868441/42/43 මඟින් ලබාගත හැක.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

2023.11.20